# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2307/65 - 2022 නොවැම්බර් මස 25 වැනි සිකුරාදා - 2022.11.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

විසල් මහනුවර නගර සංවර්ධන සැලැස්ම යටතේ පරිපාලන කටයුතු ඇතුළු මිශ්‍ර සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාව විස්තර* :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳුකර ඉහල කොරළේ අංගම්මන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මැනුම්පති විසින් මැන පිළියෙල කරන ලද අංක සී.එම් 320176(02) 4 දරන පිඹුරේ කැබැලි අංක 36 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0076 ක් වන දික්කඹුර නම් ඉඩම් කොටස හා එම පිඹුරේ කැබලි අංක 39 සිට 41 දක්වා ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1057 ක් වන අහමුරුතකුඹුර නම් ඉඩම් කොටස හා සී.එම් 320175(01) 19 දරන පිඹුරේ කැබලි අංක 2,3, හා 4 දක්වා ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1191 ක් වන දිවෙලකුඹුර නම් ඉඩම් කොටස හා එම පිඹුරේ කැබලි අංක 5,6,8 හා 9 දක්වා ප්‍රමාණයන් හෙක්ටයර් 0.4338 න් වන වලලියද්දේකුඹුර නම් ඉඩම් කොටස හා සී.එම් 320122(02)31 දරන පිඹුරේ කැබැලි අංක 370 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3783 ක් වන දෙමල්ගිරිය නම් ඉඩම් කොටස එම පිඹුරේ කැබැලි අංක 371 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2458 ක් වන පට්ටිය ලියද්ද නම් ඉඩම් කොටස හා 372, 373, 374, 375, 376, 377, 378, 379, 380, 381, 382, 383 හා 384 දක්වා ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.7646 ක් වන නාමල්වෙල හෙවත් පට්ටියේකුඹුර නම් ඉඩම් කොටස 386 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0964 ක් වන රදවාකුඹුර නම් ඉඩම් කොටස එම පිඹුරේ කැබලි අංක 387 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.2337 ක් වන නැකැත්තා කුඹුර, ලබුව රදවා කුඹුර සහ මහකලවිට නම් ඉඩම් කොටස කැබලි අංක 388 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2996 ක් වන වලකිරියකුඹුර නම් ඉඩම් කොටස හා එම පිඹුරේ කැබලි අංක 391 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0264 ක් වන ඉඩම් කොටස එම පිඹුරේ කැබැලි අංක 392 හා 393 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4 දිවෙන කුඹුර නම් ඉඩම් කොටස එම පිඹුරේ කැබැලි අංක 394 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2292 ක් වන නාමල්වෙල, මහකලවිට, ලබුව නැකැත්තා කුඹුර සහ රදවා කුඹුර නම් ඉඩම් කොටස එම පිඹුරේ කැබැලි අංක 395 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0093 ක් වන ඉඩම් කොටස හා එම පිඹුරේ කැබැලි අංක 396 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0017,397 හා 400 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4308 ක් වන නාමල්වෙල, මහකලවිට, ලබුව නැකැත්තා කුඹුර, රදවා කුඹුර, 401හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3918 ක් දිවෙලකුඹුර නම් ඉඩම් කොටස් .(කැබැලි විස්තර ලැයිස්තුව අමුණා ඇත.)

වන්දි පරීක්ෂණ දිනයන් හා වේලාව

| අනු අංකය | පිඹුරු අංකය | කැබැලි අංකය | වන්දි පරීක්ෂණ දිනය | වේලාව | ස්ථානය |
|---|---|---|---|---|---|
| 1 | සි.එම් 320176(02)4 | 36,39,41 | 2023.01.27 | පෙ.ව. 10.00 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, උඩ පාළාත, ගම්පොල. |
| 2 | සි.එම් 320176(01)19 | 2,3,4,5,6,8 | 2023.02.03 | පෙ.ව. 10.00 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, උඩ පාළාත, ගම්පොල. |
| 3 | සි.එම් 320122(02) | 370,371,372,373,374, 375,376,377 | 2023.02.10 | පෙ.ව. 10.00 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, උඩ පාළාත, ගම්පොල. |
| 4 | සි.එම් 320122(02) | 378,379,380,381,382, 383,384,386,387 | 2023.02.17 | පෙ.ව. 10.00 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, උඩ පාළාත, ගම්පොල. |
| 5 | සි.එම් 320122(02) | 388,391,392,393,394, 395,396,397,400,401 | 2023.02.24 | පෙ.ව. 10.00 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, උඩ පාළාත, ගම්පොල. |

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ ඉහත දිනයහි නියමිත වේලාවට උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තව ද, නියමිත දිනට සති දෙකකට මත්තෙන් ඒ ඉඩම් /ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ආර්.ඒ.ඩී.ටී.එන්. තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත.

මගේ අංකය: KDS/UDP/4/1/02/01
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 13/99VEP/414
2022 නොවැම්බර් මස 24 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

EOG 11 - 0304

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.